සැ. යු.-2012.01.20 දින පළ වූ අංක 1,742 දරන *ගැසට් පත්‍රයේ* I-III සහ IV(අ) කොටස් පළ නොවීය.

මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2012 වර්ෂය සඳහා තංගල්ල මහාධිකරණකලාපයට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල භාෂාවෙන් පමණක් පළවේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,743 - 2012 ජනවාරි මස 27 වැනි සිකුරාදා - 2012.01.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 96 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 101 |


*සැ. යු.-* ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 දෙසැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

වැලන්හින්න වාචිස්සර ජාත්‍යන්තර සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 දෙසැම්බර් මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

අල් ඉමාන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 දෙසැම්බර් මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 පෙබරවාරි මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජනවාරි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## අධිකරණ සේවා කොමිෂන් සභාව

පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල ක්වාසි තනතුරු සඳහා බඳවා ගැනීම පිණිස මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ (115 පරිච්ඡේදය) යටතේ අයදුම්පත් කැඳවීම

පහත සුදුසුකම් ඇති පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු මුස්ලිම් පිරිමියකු විය යුතු අතර, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රධානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකය දරන්නකු හෝ නීතිඥයකු හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයකු විය යුතු ය.

දැනට රජයේ සේවයේ නියුත්තයකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරුවන් වයස අවු. 40ට වැඩි යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පිළිබඳව විශේෂිත වූ ඉස්ලාම් නීතිය ගැන හොඳාකාර දැනීමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයකු විය යුතු ය.

තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාල සීමාවක් සඳහා පත්කරනු ලැබේ.

ක්වාසිවරයකු තමා පත් කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිව සිටීම නීතිමය වශයෙන් අවශ්‍යය.

ක්වාසිවරයකුට මසකට රු. 6,000 ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රු. 5,000 ක ගෙවීමක් කරනු ලැබේ.

අයදුම්පත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය මගින් ලබාගත හැකි අතර, එය සම්පූර්ණ කොට ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ක්වාසි තනතුර සඳහා" යනුවෙන් සඳහන් කර 2012 පෙබරවාරි මස 20 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතු ය.

සුදත් එන්. ගොපල්ලව,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

2012 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| 01. හැටන් | : | හැටන් අධිකරණ බල ප්‍රදේශයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. |

01-676

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි තනතුරු (පිරිමි සහ කාන්තා)

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පිරිමි සහ කාන්තා උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි/නිලධාරිනි තනතුරු සඳහා 2012 ජනවාරි මස 29 වැනි දින සිට 2012 පෙබරවාරි මස 29 වැනි දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, ත්‍රිවිධ හමුදාවේ නිත්‍ය සේවයේ අධිකාරි තනතුරු සඳහා බඳවා ගන්නා ලදුව, උපාධියට නියමිත හමුදා සහ අධ්‍යයන විෂයයන් සාර්ථකව නිමකිරීමට සමත්වන කෙඩෙට් නිළධාරි/නිලධාරිනියන්ට උපාධි පිරිනැමීම සඳහා, 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨ පනත හා එම පනතේ සංශෝධන මගින් බලය පවරා ඇති විශ්වවිද්‍යාලයකි.

03. මෙම උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි/නිලධාරිනි තනතුරුවලට අදාළ උපාධි පාඨමාලාවන් අතුරින් වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී උපාධි පාඨමාලාව අවුරුදු පහක් (05) ද, ඉංජිනේරු උපාධි පාඨමාලාව අවුරුදු හතරයි මාස හයක්ද (04 1/2) ද, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ හා නීති උපාධි පාඨමාලා අවුරුදු හතරක් (04) ද, වන අතර කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධිය, හටකාර්ය කළමනාකරණ උපාධි පාඨමාලාව හා සමාජ විද්‍යා උපාධි පාඨමාලාව සඳහා කාලසීමාව අවුරුදු තුනක් (03) ද වේ.

3.1 උපාධි පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන කෙඩෙට් නිලධාරීන් නිලධාරිනියන් ත්‍රිවිධ හමුදාවට අනුයුක්ත කිරීම එම හමුදාවල ඇති පුරප්පාඩු සංඛ්‍යාව සහ තෝරාගැනීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්‍ෂණවලදී අපේක්‍ෂයින් ලබාගන්නා මුළු ලකුණු සංඛ්‍යාව ද පදනම් කොටගෙන සිදුකෙරෙනු ඇත. උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවුක හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිත්‍ය බල සේනාවල අධිකාරිලත් තනතුරු සඳහා පත් කරනු ලැබේ.

3.2 නියමිත උපාධි පාඨමාලා සහ හමුදා පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව ඔවුනට අදාළ පරිදි වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී (එම්. බී. බී. එස්.) උපාධිය හෝ, විද්‍යාවේදී (බී. එස්. සී) ඉංජිනේරු උපාධිය හෝ, විද්‍යාවේදී (බී. එස්. සී) තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ උපාධිය හෝ නීතිවේදී (එල්. එල්. බී.) උපාධිය හෝ, විද්‍යාවේදී (බී. එස්. සී) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධිය හෝ, විද්‍යාවේදී (බී. එස්. සී) හටකාර්ය කළමනාකරණ උපාධිය හෝ, විද්‍යාවේදී (බී. එස්. සී.) සමාජය විද්‍යා උපාධිය පිරිනමනු ලැබේ.

3.3 සියලු උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

3.4 තෝරාගනු ලබන අපේක්‍ෂකයින් ඔවුන්ගේ සුදුසුකම්වලට අනුකූලව පහත දැක්වෙන උපාධි පාඨමාලාවලින් එකක් හැදෑරිය යුතු ය.

(අ). *වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී (එම්. බී. බී. එස්.) උපාධි පාඨමාලාව.*—කාලසීමාව අවුරුදු පහකි (05). (පිරිමි/කාන්තා).
*අ. පො. ස. (උ.පෙළ) විභාගය 2011 අධ්‍යන වර්ෂයේ දී,* ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයයන් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) 03ක් සහිතව ජීව විද්‍යා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල

ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා,

(ආ) *විද්‍යාවේදී (බී. එස්. සී.) සිවිල්/යාන්ත්‍රික/විදුලි හා විද්‍යුත්/විද්‍යුත් හා විදුලි සංදේශ/නාවුක ගගන ඉංජිනේරු උපාධි පාඨමාලාව.* කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි (අවු. 4 1/2) (පිරිමි).

අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ගණිත විෂයය ධාරාව හදාරා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ 03ක් සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා,

(ඇ) විද්‍යාවේදී (බී. එස්. සී) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධි පාඨමාලාව කාලසීමාව අවුරුදු හතරකි. (අවු. 4) (පිරිමි/කාන්තා).

අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) 03ක් සහිතව විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා,

(ඈ) *නීතිවේදී (එල්. එල්. බී.) උපාධි පාඨමාලාව.—කාලසීමාව අවුරුදු හතරකි. (04) (පිරිමි/කාන්තා).*

අ. පො. ස. (උ.පෙළ) විභාගයේ දී පහත සඳහන් විෂයයන් තුනකට (03) අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ 03ක් ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා—

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | දේශපාලන විද්‍යාව | කෘෂි විද්‍යාව |
| භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයනය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ඉතිහාසය | භෞතික විද්‍යාව |
| රසායන විද්‍යාව | ආර්ථික විද්‍යාව | උසස් ගණිතය |
| සිංහල/දෙමළ | ඉංග්‍රීසි (විෂය අංක 73) | |
| ගණිතය/සංයුක්ත ගණිතය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | |

(ඉ) *විද්‍යාවේදී (බී. එස්. සී.) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධි පාඨමාලාව.*—කාලසීමාව අවුරුදු තුනකි (03). (පිරිමි /කාන්තා).

අ. පො. ස. (උ/පෙළ) විභාගය සඳහා ගණිතය විෂය ධාරාව හෝ ජීව විද්‍යා විෂය ධාරාව හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ 03ක් ලබා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(ජීව විද්‍යා විෂය ධාරව හදාරා ඇති අපේක්ෂකයින් අ. පො. ස. (උ.පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව හෝ ගණිතය විෂයක් ලෙස හදාරා සමත්ව තිබිය යුතු ය.)

(ඊ) *විද්‍යාවේදී (බී. එස්. සී.) හටකාර්ය කළමනාකරණ උපාධි පාඨමාලාව.*—කාලසීමාව අවුරුදු තුනකි (03) (පිරිමි/කාන්තා).

අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී පහත සඳහන් විෂයයන් අතරින් විෂයයන් තුනක් (03) සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා—

| | |
|---|---|
| ගිණුම්කරණය | භූගෝල විද්‍යාව |
| ව්‍යාපාර අධ්‍යයනය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| ආර්ථික විද්‍යාව | ගණිතය/සංයුක්ත ගණිතය |
| ව්‍යාපාර සංඛ්‍යානය | තොරතුරු හා ජනමාධ්‍ය පිළිබඳ අධ්‍යයනය |
| තොරතුරු තාක්ෂණය | ඉංග්‍රීසි (විෂය අංක 73) |

(උ) *විද්‍යාවේදී (බී. එස්. සී) සමාජ විද්‍යා උපාධි පාඨමාලාව.*—කාලසීමාව අවුරුදු තුනකි (03) (පිරිමි/කාන්තා)

පහත සඳහන් විෂයයන්ගෙන් අවම වශයෙන් විෂයයන් දෙකක් (02) සහිතව අ. පො. ස. (උ./පෙළ) විභාගයේ දී විෂයයන් තුනකින් (03) සමත් වූවන් සඳහා

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | ආර්ථික විද්‍යාව |
| ව්‍යාපාර අධ්‍යයනය | ව්‍යාපාර සංඛ්‍යානය |
| ගණිතය | දේශපාලන විද්‍යාව |
| තොරතුරු තාක්ෂණය | තොරතුරු හා ජනමාධ්‍ය පිළිබඳ අධ්‍යයනය |
| ඉතිහාසය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| ඉංග්‍රීසි (විෂය අංක 73) | සිංහල/දෙමළ |

3.5 තෝරාගනු ලබන කෙඩෙට් නිලධාරින්/නිලධාරිනීන් එම පාඨමාලාවට අදාළ පොදු විෂයයන්ට අමතරව ඉංග්‍රීසි, කළමනාකරණය, නීතිය, අන්තර්ජාතික අධ්‍යයනය හා හමුදා විෂයයන් ද අනිවාර්යයෙන්ම හැදෑරිය යුතු ය.

3.6 මීට අමතරව ශාරීරික වර්ධනය, සරඹ හා අවි පුහුණුව, නායකත්වය ආදිය පිළිබඳව ද පාඨමාලා කාලය තුළ දී අඛණ්ඩ පුහුණුවීම්වල යෙදිය යුතු ය.

04. *කෙඩෙට් නිලධාරි/නිලධාරිනි තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :* *අයදුම්කරුවන්.*—

(අ) ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

(ආ) 2012 පෙබරවාරි මස 29 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 22ට නොවැඩි විය යුතු යි.

*අධ්‍යාපන සුදුසුකම් :*

(ඇ) අ. පො. ස. උසස් පෙළ විභාගයෙන් අදාල විෂයය ධාරාවෙන්, විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ 3ක් ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා සලකා බැලීමට අවශ්‍ය/අවම සුදුසුකම් (YES) සපුරා තිබීමට ; සහ

(i) සාමාන්‍ය පොදු පරීක්ෂණයෙන් සමත්වීම;

(ii) අවම වශයෙන් අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයයට සම්මාන (සී) සාමාර්ථයක් ලබා තිබීම.

(ඈ) පහත සඳහන් අවම ශාරීරික මිනුම් (සම්මතයන්) සපුරා ලිය යුතු ය.

| | | *පිරිමි* | *කාන්තා* |
|---|---|---|---|
| උස : | යුද හමුදාව | - 5' 6" | 5' 3" |
| | නාවික හමුදාව | - 5' 6" | — |
| | ගුවන් හමුදාව | - 5' 6" | 5' 4" |
| බර : | යුද හමුදාව | කිලෝ ග්‍රෑම් 50 | — |
| පපුව : | | 32" (ප්‍රශ්වාස) | |

*සටහන.*—ක්‍රීඩා හෝ වෙනත් අදාළ විෂයයන් හි සුවිශේෂ කුසලතා දක්වා ඇති අයදුම්කරුවන් සඳහා ඉහත සඳහන් ශාරීරික මිනුම් පිළිබඳ අවශ්‍යතාවයන් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අභිමතය පරිදි ලිහිල් කිරීමට අවකාශ ඇත.

(ඉ) මනා සෞඛ්‍ය තත්ත්වයක සිටිය යුතු අතර, පෙර කී අවශ්‍යතාවයන්ට අමතරව ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා සෑහීමට පත්වන පරිදි වෛද්‍ය පරීක්ෂණයකින් ද සමත් විය යුතුයි.

(ඊ) අවිවාහක විය යුතුවේ. (උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුට/නිලධාරිනියකට පුහුණුවීම් කාලය තුළ දී විවාහ වීමට අවසර නොමැති අතර, සේවා රෙගුලාසි මගින් අවකාශ සැලසෙන තෙක් විවාහ වීමට අවසර දෙනු නොලැබේ.)

5. *සේවා කොන්දේසි.*—තෝරාගනු ලබන අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරින්/නිලධාරිනියන් ලෙස බඳවා ගැනේ. ඔවුන් 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨ පනත සහ එම පනතේ සංශෝධනයන්ට ද අනුකූලව පනවන ලද්දා වූ නීති, රෙගුලාසි සහ නියෝගයන්ට යටත් වනු ඇත.

6. බඳවාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්කිරීම හා අදාල උපාධිය ලබා ගැනීමෙන් පසුව එම සේවාවන්ට අදාලවන පරිදි අනිවාර්ය සේවා කාලයක් සේවය කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතු ය.

7. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියකුට/නිලධාරිනියකට හිමි වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියකුගේ/නිලධාරිනියකුගේ මාසික වැටුප ආසන්න වශයෙන් රු. 24,000 ක් පමණ වේ. මෙයට අමතරව පහත සඳහන් පහසුකම් ද නොමිලේ සපයනු ලැබේ.

(i) ආහාර හා නවාතැන්
(ii) නිළ ඇඳුම්
(iii) අනුගාමික සේවාවන්
(iv) ක්‍රීඩා හා විනෝද පහසුකම්
(v) වෛද්‍ය පහසුකම්

8. ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිත්‍ය සේවාවන්ට පත්කිරීමෙන් අනතුරුව ඔවුන් තම පදවිවලට අදාළ වන පරිදි එම සේවාවන්ට බලපාන වැටුප් සහ දීමනා සඳහා හිමිකම් ලබනු ඇත.

අ. ලුතිතන් කර්නල්/කොමාන්ඩර්/විංග් කොමාන්ඩර් නිලය දක්වා නිලධාරීන්ට දැනට ගෙවනු ලබන ඒකාබද්ධ වැටුප් ප්‍රමාණ පහත දැක්වේ.

දෙවන ලුතිතන් - වර්ෂයකට රු. 211,800
නියමු නිලධාරි - වර්ෂයකට රු. 229,200
වැඩ බලන උප ලුතිතන් - වර්ෂයකට රු. 189,240
ලුතිතන්/උප ලුතිතන් පියාසර නිලධාරි - වර්ෂයකට රු. 275,220 - 30 x 7,740 - රු. 507,420
කපිතාන්/ලුතිතන් /බලපත්‍ති ලුතිතන් - වර්ෂයකට රු. 321,660 - 24 x 7,740 - රු. 507,420
ලුතිතන් කොමාණ්ඩර් /බලසන නායක - වර්ෂයකට රු. 352,620 - 20 x 7,740 - රු. 507,420
මේජර් - වර්ෂයකට රු. 368,100 - 22 x 7,740 - රු. 538,380
කොමාණ්ඩර්/විංග් කොමාන්ඩර්- වර්ෂයකට රු. 362,100 - 15 x 9,480 - රු. 504,300
ලුතිතන් කර්නල් - වර්ෂයකට රු. 390,540 - 17 x 9,480 - රු. 551,700

(ආ) පහත සඳහන් මාසික දීමනාවන් ද ගෙවනු ලැබේ :–
(i). සුදුසුකම් දීමනා;
(ii). ආහාර දීමනාව;
(iii). ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාවක්; (විවාහක නිලධාරීන්ට පමණක්)
(iv). නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව.

(ඇ) පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ/දීමනා ගෙවනු ලැබේ.

(i). ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලේ නේවාසික පහසුකම්;
(ii). කුලී නිවාසයක වාසය කරන විට සීමිත ගෙවල් කුලී;
(iii). නිල ඇඳුම් දීමනා;
(iv). විවාහක නිලධාරීන්ට අනුගාමික දීමනා/අවිවාහක නිලධාරීන්ට අනුගාමික සේවය;
(v). ඇතුළත විසීමට නියෝග ලැබ සිටින නිලධාරීන්ට රාජකාරි ස්ථානයේ සිට නිවස දක්වා යාමට සහ ඒමට මසකට වරක් රාජකාරි දුම්රිය බලපතක්.

9. ශ්‍රී ලංකා යුද, නාවුක සහ ගුවන් හමුදා නිලධාරීන්ගේ වැටුප් හා සේවා කොන්දේසි පහත සඳහන් රෙගුලාසි මඟින් පාලනය වනු ඇත.

(අ). යුද හමුදා/නාවික හමුදා/ගුවන් හමුදා වැටුප් සංග්‍රහය;
(ආ). යුද හමුදා/නාවික හමුදා/ගුවන් හමුදා නිලධාරින් උදෙසා *ශ්‍රී ලංකා ගැසට් පත්‍රයේ* පළකරනු ලබන වලංගු රෙගුලාසි;
(ඇ). *ශ්‍රී ලංකා ගැසට් පත්‍රයේ* පළකරන වලංගු යුද හමුදා/නාවික හමුදා/ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය.

10. පුහුණුවීම් කාලය තුළ දී උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරින් /නිලධාරිනියන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උපකුලපති සහ/හෝ අදාළ හමුදාපතීන් විසින් නියම කරනු ලබන පුහුණුවීම්වල නිරත විය යුතු වේ.

11. පුහුණුව ලබන උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරින් පුහුණුවීම් සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඕනෑම ප්‍රදේශයකට පත්කොට යැවිය හැක.

12 පුහුණුව ලබන උපාධි අපේක්ෂක නිලධාරීන්/නිලධාරිනියන්, ඔවුන් සඳහා වෙන්කොට ඇති නේවාසික ස්ථානයන්හි සිටිය යුතු අතර, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ හෝ අදාළ වෙනත් සේවා ආයතන මගින් පනවන ලද දින චර්යාවන් අනුගමනය කළ යුතුයි.

13 *භාෂා අවශ්‍යතා.* - තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු වස් මේ දක්වා පනවනු ලැබ ඇත්තා වූ ද, ඉදිරියේ දී පනවනු ලැබිය හැක්කා වූ ද, නීතින්ට අනුකූලව කටයුතු කළ යුතුයි.

14. *අනන්‍යතාවය ඔප්පු කිරීම.*-අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හෝ තැපැල්පති විසින් නිකුත් කරන ලද හඳුනා ගැනීමේ පත හෝ මෝටර් රථවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය පිළිගනු ලැබේ.

15. *අයදුම්පත්.*—මෙම විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් අදාළ අයදුම්පත්‍රය ලබාගෙන අයදුම් කළ හැක. මෙම විශ්වවිද්‍යාල වෙබ් අඩවිය www.kdu.ac.lk

16. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් එවීමේ දී ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට රුපියල් දාහක (රු. 1,000) මුදලක් "උපකුලපති, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය" නමින් ලංකා බැංකුවේ "මොරටුව – ඉඩම" ශාඛාවේ අංක "9405831" ගිණුමට බැරකර, ඔබ වෙත ලැබෙන ලදුපතේ අයදුම්පත සමග අමුණා එවිය යුතු ය. අවශ්‍ය මූලික සුදුසුකම් නොමැති හෝ ඉල්ලුම්පත් නිසි ලෙස සම්පූර්ණ කර නොමැති හෝ මෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල නොවන හෝ අයදුම්පත්, කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙන අතර, අයදුම්පත් එවීමේ දී ගෙවනු ලැබූ මුදල් කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලැබේ. තව ද අයදුම්පත සමග රු. 30 (රුපියල් තිහක්) වටිනා මුද්දර ඇලවූ, තම නම සහ ලිපිනය ලියූ (9" x 4" ප්‍රමාණයේ) ලියුම් කවරයක් ද එවිය යුතු ය.

17. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර 2012 පෙබරවාරි මස 29 වැනි දින හෝ එදිනට පෙරාතුව ලැබෙන සේ ''ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම් පත්‍රය බහා එවන කවරයේ ඉහල වම් කෙළවරේ ''කෙඩෙට් නිලධාරී/නිලධාරිනී තනතුර සඳහා අයදුම්පත'' යනුවෙන් සහ ඉල්ලුම් කරනු ලබන විෂය ධාරාව සඳහන් කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත්‍ර සහ මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන්නා වූ ඉල්ලුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

18. රාජ්‍ය හෝ සංස්ථා සේවයෙහි නිරත නිලධාරීන්ගේ/ නිලධාරිනියන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර එකී අයදුම්කරුවන් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය අදාළ තනතුරෙන් නිදහස් කළ හැකි බව සඳහන් අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද තිබිය යුතු ය.

19. උප්පැන්න සහතිකය, අ. පො. ස. (සා/පෙළ), අ. පො. ස. (උ/පෙළ) විභාග සඳහා ලද ප්‍රතිඵල ලේඛනවල සහතික කරන ලද ඡායා පිටපත් සහ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට (Yes) නිකුත් කරන ලද ප්‍රතිඵල සටහනේ පිටපතක් යන ලේඛනවල පිටපත් පමණක් අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතු ය.

20. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය මගින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති, අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් කරනු ඇත. මෙසේ තෝරා ගනු ලබන්නා වූ අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමණාකරණ මණ්ඩලය විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන්නා වූ වෙනත් පරීක්ෂණයන්ට ද පෙනී සිටිය යුතු වේ.

21 සම්මුඛ පරීක්ෂණ සහ වෙනත් පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අපේක්ෂකයින්ට එම පරීක්ෂණ පවත්වනු ලබන ස්ථාන, වේලාවන් හා දින ලිඛිතව දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරන්නට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් මෙම විශ්ව විද්‍යාලය මගින් ගෙවනු නොලැබේ.

22 අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරනු ලබන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට ඒ පිළිබඳව සහතිකයක් ලබා දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම හෝ නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේ ය.

23. අයදුම්පත් ලද බැව් මෙම විශ්වවිද්‍යාලය විසින් දැනුම් දෙනු නොලැබේ. ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් සම්බන්ධව කෙරෙන විමසුම් හෝ ලියකියවිලි ද පිළිගනු නොලැබේ.

ගෝඨාභය රාජපක්ෂ
ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන
අමාත්‍යාංශයේ ලේකම් සහ,
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල
ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමණාකරණ මණ්ඩලයේ සභාපති.

[ ]
කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරී/නිලධාරිණී තනතුරු සඳහා අයදුම්පත

ජා. හැ. අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

ඉල්ලුම්කරනු ලබන විෂය ධාරාව :

| වෛද්‍යවේදී | ඉංජිනේරු | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | කළමණාකරණ හා සන්නිවේදන තාක්ෂණය | නීති | හට කාර්ය කළමණාකරණය | සමාජ විද්‍යා |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

(සුදුසුකම් මත ඔබගේ අභිමතය පරිදි විෂය ධාරාවන් තුනක් 1,2 සහ 3 යනුවෙන් සඳහන් කළ හැකිය).

01. නම

(*a*) සම්පූර්ණ නම :

(*b*) මුලකුරු සමඟ නම : මයා/මෙනවිය :

02. (*a*) ස්ථිර ලිපිනය :

(*b*) ස්ථාවර දුරකථන අංකය : ජංගම දුරකථන අංකය :

03. උපන් දිනය :

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

04. 2012.02.29 වැනි දිනට වයස :

| වර්ෂ | මාස | දින |
|---|---|---|
| | | |

05. විවාහක/අවිවාහක බව :

| විවාහක | අවිවාහක |
|---|---|
| | |

06. ස්ත්‍රී/පුරුෂ භාවය :

| ගැහැණු | පිරිමි |
|---|---|
| | |

07. ශ්‍රී ලාංකික පුරවැසිභාවය : උපතින් : [ ] ලියාපදිංචි වීමෙන් : [ ]

08. අධ්‍යාපන සුදුසුකම් :

(*a*) අ.පො.ස. (සා.පෙළ.) විභාගය :

පාසලේ නම :————.
විභාග අංකය :————.
අවුරුද්ද :————.

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1. | ————. | ————. |
| 2. | ————. | ————. |
| 3. | ————. | ————. |
| 4. | ————. | ————. |
| 5. | ————. | ————. |
| 6. | ————. | ————. |
| 7. | ————. | ————. |
| 8. | ————. | ————. |
| 9. | ————. | ————. |

(*b*) අ. පො. ස. (උ/පෙළ) විභාගය

පාසලේ නම :————.
විභාග අංකය :————.
අවුරුද්ද :————.

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1. | ————. | ————. |
| 2. | ————. | ————. |
| 3. | ————. | ————. |
| 4. | සාමාන්‍ය ඉංග්‍රීසි | ————. |
| 5. | සාමාන්‍ය පොදු පරීක්ෂණය | [ ] |
| 6. | 'Z' ලකුණ | ————. |

විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබේද?

| ඔව් | නැත |
|---|---|
| | |

අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා ලබාගත් ඉහලම සාමාර්ථය [ ]
(i). විභාග අංකය [ ]
(ii). අවුරුද්ද [ ]
'Z' ලකුණු : [ ]

09. ක්‍රීඩා කුසලතා

| | * SL | * ZL | * NL | * INL |
|---|---|---|---|---|
| (*a*) මලල ක්‍රීඩා | | | | |
| (*b*) බැඩ්මින්ටන් | | | | |
| (*c*) පැසිපන්දු | | | | |
| (*d*) ක්‍රිකට් | | | | |
| (*e*) හොකී | | | | |
| (*f*) රගර් | | | | |
| (*g*) පාපන්දු | | | | |
| (*h*) පිහිනුම් | | | | |
| (i) ටේබල් ටෙනිස් | | | | |
| (j) ටෙනිස් | | | | |
| (k) වොලිබෝල් | | | | |
| (l) මල්ලව පොර | | | | |
| (m) කරාතේ | | | | |
| (n) ජූඩෝ | | | | |
| (o) බොක්සින් | | | | |
| (p) ස්කොෂ් | | | | |
| (q) | | | | |
| (r) | | | | |

*SL-පාසල් මට්ටම *ZL-කලාප මට්ටම

*NL-ජාතික මට්ටම *INL-අන්තර් ජාතික මට්ටම

10. බාහිර ක්‍රියාකාරකම් :

| | |
|---|---|
| (*a*) කැඩෙට් | |
| (*b*) බාල දක්ෂ | |
| (*c*) ශිෂ්‍ය නායක | |
| (*d*) විදුහල් නායක | |
| (*e*) නිවාස නායක | |
| (*f*) සංගීත කණ්ඩායම් සාමාජික | |
| (*g*) සමාජයීය ක්‍රියාකාරකම් | |
| (*h*) ප්‍රථමාධාර | |
| (*i*) | |

11. *ශාරීරික යෝග්‍යතාවය.—*

| උස | | බර | දෘෂ්ටිකත්වය | | | පපුව |
|---|---|---|---|---|---|---|
| අඩි | අඟල් | කිලෝ | දකුණු | වම් | කණ්නාඩි පැලැඳ | අඟල් |
| | | | | | | |

12. වෙනත් දක්ෂතා :————.
(අවශ්‍ය නම් ඇමුණුමක් සම්බන්ධ කළ හැක)

13. භාරකරුවාගේ හෝ ඉතා කිට්ටු ඥාතියකු පිළිබඳ විස්තර :
(*a*) නම :————.
(*b*) ඥාතීත්වය :————.
(*c*) ලිපිනය :————.
(*d*) ස්ථාවර දුරකථන අංකය :————. ජංගම දුරකථන අංකය :————.

14. උපකුලපති ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය නමින් ලංකා බැංකුවේ, මොරටුව, "ඉඩම ශාඛාවේ" අංක 9405831 දරන ජංගම ගිණුමට ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් රුපියල්

දාහක් (රු. 1000) බැර කර පහත සඳහන් විස්තර සඳහන් කරන්න. (මුදල් ගෙවූ ලදුපත මෙම ඉල්ලුම්පත සමග අමුණා එවිය යුතු ය.) :

(i). මුදල් ගෙවූ දිනය :————.

(ii). මුදල් ගෙවූ ලංකා බැංකු ශාඛාව :————.

15. මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම අනුව සත්‍ය හා නිවැරදි බැව් ගෞරවයෙන් යුතුව ප්‍රකාශ කරමි. තව ද මෙම ඉල්ලුම් පත්‍රයේ ම විසින් දක්වා ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුර සඳහා නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව අනාවරණය වුවහොත් මාහට කිසිම වන්දියකින් තොරව මෙම තනතුර අහිමි වන බවත්, මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

01-841

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2012 මාර්තු

1991 මැයි මස 17 වැනි දින හා අංක 662/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද සෞඛ්‍ය සේවාවේ වෛද්‍ය නිලධාරීන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් ස්ථිර කිරීමට පෙර සමත් විය යුතු වන දෙපාර්තමේන්තු විභාගය 2012 මාර්තු මස 25 වැනි දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා කාල සටහන ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02. *සුදුසුකම්.*—මෙම විභාගයට අයදුම් කළ හැක්කේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ගෙන් මෙතෙක් අදාළ විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට පමණි.

03. *අයදුම්පත්.*—මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් කොළඹ 10, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, සෞඛ්‍ය අමාත්‍යාංශයේ "සුවසිරිපාය" ගොඩනැගිල්ලේ අධ්‍යක්ෂ (විභාග) වෙත 2012 මාර්තු මස 05 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පත්‍රයකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව කොට්ඨාස ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය. තම අයදුම්පත සමග ලිපිනය ලියන ලද රු. 30.00 ක් වටිනා මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක්ද එවිය යුතු ය. (මෙහි කැමති පරිදි රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලිවිය හැකිය). ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැ. යු.*—ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය A4 වර්ගයේ කඩදාසියක පළමු පිටුවේ අංක 1 සිට 4 (ඈ) දක්වාත් දෙවන පිටුවේ අංක 4 (ඈ) සිට අංක 8 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සහ අසම්පූර්ණ සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. *විභාග ගාස්තු .*—

(i) විභාගයට පළමුවන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25 බැගින් අවලංගු නොකළ මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන සහ දිනය යොදා ඒවා නිසිලෙස අවලංගු කළ යුතු ය;

(ii) කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. *විභාගයට ඇතුළත් කර ගැනීම* :—

(i) පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ii) විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළ දී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය. :

(*අ*) පුද්ගල හැඳුනුම්පත්‍රය;
(*ආ*) දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත්‍රය;
(*ඇ*) රියදුරු බලපත්‍රය;
(*ඈ*) විදේශ ගමන් බලපත්‍රය

(iii) කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් මත විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුනේ නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පරීක්ෂාකර මධ්‍යස්ථානය සහ විභාග අංකය සොයාගත හැකිය. එසේ ඔබේ නමට අදාළ විභාග අංකය සහ විභාග මධ්‍යස්ථානය සොයා ගත්තේ නම් ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිධාරියා වෙතින් අත්සන සහතික කරන ලද ලිපියක්ද සමග වෙබ් අඩවියේ සඳහන්ව තිබූ විභාග මධ්‍යස්ථානයට පැමිණ ඔබේ අනන්‍යතාවය තහවුරු කර විභාගයට පෙනී සිටිය හැකිය. (වෙබ් අඩවිය : WWW. health. gov.lk)

6. *විභාග පරිපාටිය* :—

මෙම විභාගය ලිඛිත ප්‍රශ්න පත්‍ර තුනකින් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයකින් සමන්විතය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50ක් ලබාගත යුතු ය. එක් වරකදී හෝ කිහිපවරකදී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. නිලධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේදී අදාළ සියලුම විෂයන්ට පෙනී සිටිය යුතු ය.

07. විභාග විෂය නිර්දේශ මාලාව :

07.1 ලිඛිත විභාගය

07.1.1 ආයතන සංග්‍රහය

කාලය පැය 02යි. ප්‍රශ්න 08කින් ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතු ය.

*විෂය නිර්දේශය* :

(i) ආයතන සංග්‍රහය :

(*අ*) I කොටස - II, III, V, VI, VII, VIII, IX, XI XII, XIII, XV, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXI XXXII, XXXIII පරිච්ඡේදයන්

(ආ) II කොටස - XLVII සහ XLVIII වැනි පරිච්ඡේදයන්

(ii) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය රෙගුලාසි.

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සංයුතිය හා කාර්යභාරය

07.1.2 *රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය* :

කාලය පැය 1 1/2 යි. ප්‍රශ්න 07කින් ප්‍රශ්න 04කට පිළිතුරු සැපයිය යුතුය.

විෂය නිර්දේශය :

සෞඛ්‍ය සේවා සංග්‍රහය :
I වැනි කොටස - වෛද්‍ය සේවා
II වැනි කොටස - රසායනාගාර සේවා

07.1.3 *ගිණුම්* :

කාලය පැය 02 යි. ප්‍රශ්න 07කින් ප්‍රශ්න 04කට පිළිතුරු සැපයිය යුතුය.

විෂයය නිර්දේශය :

(i) රජයේ මුදල් රෙගුලාසි—

| | | |
|---|---|---|
| පරිච්ඡේද I | - | සියලුම වගන්ති |
| පරිච්ඡේද II | - | සියලුම වගන්ති |
| පරිච්ඡේද III | - | සියලුම වගන්ති |
| පරිච්ඡේද IV | - | සියලුම වගන්ති |
| පරිච්ඡේද V | - | 1, 2, 3, 4 සහ 6 වගන්ති |
| පරිච්ඡේද VI | - | සියලුම වගන්ති |
| පරිච්ඡේද VII | - | 1, 2, 3, 4 සහ 6 වගන්ති |

(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම් තැබීම පිළිබඳ රෙගුලාසි

(iii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය සංවිධාන සංග්‍රහයේ මුදල් පිළිබඳ ඡේදයන්

(iv) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියකුගේ දෛනික රාජකාරිවලට අදාළ වන මුදල් රෙගුලාසි.

07.2 *සිංහල/දෙමළ වාචික පරීක්ෂණය* :

සිංහල/දෙමළ භාෂා ප්‍රවීනතාවය මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් කොළඹ දී පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙනයාමේ දී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහලෙන් හෝ දෙමළෙන් සාකච්ඡා කිරීමට නිලධාරීන්ට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ.

08. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ කොට්ඨාසයේ/ විශේෂිත ව්‍යාපාරයේ/ආයතනයේ සේවයෙහි නියුතු අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www. health.gov.lk වෙබ් අඩවියේ ද ඇතුලත් කර ඇත.

එච්. එස්. ප්‍රනාන්දු,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන 02)
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

මගේ අංකය : සීඑෆ්/ඊඑක්ස්ඊ/08/2011
2012 ජනවාරි මස 09 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

ආදර්ශ අයදුම්පත

***ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2012 මාර්තු***

01. (අ) (i) අයදුම්කරුගේ නම : (සිංහලෙන් හෝ දෙමළෙන් මුලකුරු අගට යොදා ලියන්න.) :————.

(ii) අයදුම්කරුගේ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින් මුලකුරු අගට යොදා ලියන්න.)

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරුවලින් හැඳින්වෙන නම් : (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.

(iv) මුලකුරුවලින් හැඳින්වෙන නම් : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

(ආ) (i) නිල නාමය (වෛද්‍ය නිලධාරි/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි) :————.

(ii) සීමාවාසික පත්වීම ලද දිනය :————.

(iii) ප්‍රාථමික ශ්‍රේණියට පත්වීම ලද දිනය :————.

02. ඔබ මෙවර විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ (✓) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (x) ලකුණ යොදන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය | ☐ | ආයතන සංග්‍රහය | ☐ | ගිණුම් | ☐ |
| සිංහල වාචික | ☐ | දෙමළ වාචික | ☐ | | |

03. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල/ඉංග්‍රීසි/දෙමළ) :————.

04. (අ) දැන් සේවය කරන ආයතනය :————.

(ආ) එය අයත් දිස්ත්‍රික්කය :————.

(ඇ) පහත දක්වා ඇති මධ්‍යස්ථාන අතුරින් විභාගයට පෙනී සිටීමට කැමැති විභාග මධ්‍යස්ථානයට අදාළ කොටුවේ (✓) හරි ලකුණ යොදන්න. (දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් හෝ දක්වා ඇති මධ්‍යස්ථාන එකක් හෝ කිහිපයක් අවලංගු කරනු ලබන අතර එකී මධ්‍යස්ථානයට අයදුම්කරනු ලැබූ අයදුම්කරුවන් ආසන්නතම විභාග මධ්‍යස්ථානයකට හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරනු ලබන වෙනත් විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ.)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | ☐ | කඳාන | ☐ | හම්බන්තොට | ☐ | අම්පාර | ☐ |
| කළුතර | ☐ | ගාල්ල | ☐ | බදුල්ල | ☐ | වව්නියා | ☐ |
| කුරුණෑගල | ☐ | අනුරාධපුර | ☐ | රත්නපුර | ☐ | | |
| මහනුවර | ☐ | මඩකලපුව | ☐ | යාපනය | ☐ | | |

(ඈ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" x 4" ප්‍රමාණයේ රු. 30.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේ ද?

(ඉ) (i) තැපැල් ලිපිනය : (සිංහලෙන් හෝ දෙමළෙන්) :———.
(ii) තැපැල් ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේ ද ? :—————.

(ආ) එසේ පෙනී සිට ඇත්නම් මෙවර වෙනුවෙන් මුද්දර අලවා තිබේද?

| *මුද්දර කොටුව* |
|---|

06. *අයදුම්කරුගේ සහතිකය* :

මගේ දැනුම හා විශ්වාසය පරිදි;

(i) මම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ප්‍රථම වතාවට නොවන බැවින් රු............. ක් වටිනා මුද්දර අලවා ඇති බවත් මෙම ඉල්ලුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟවන බවත් සහතික කරමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

07. ආයතන ප්‍රධානියාගේ සහතිකය

..............................මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියකු වන අතර, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට වන/නොවන බවටද රු. .................. ක් වටිනා මුද්දර, මෙම මුද්දර ඉල්ලුම් පත්‍රයට අලවා ඇති බවද/මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද, මා ඉදිරිපිටදී අත්සන් කළ බවද, සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.

08. *විමධ්‍යගත කොට්ඨාශ/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය*

........................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියකු වශයෙන් මගේ කොට්ඨාසයේ/ව්‍යාපාරයේ සේවය කරන බවත්, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

————,
විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත
ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය.)

දිනය :—————.

(අනවශ්‍ය කොටස් කපා හරින්න.)

01-678

---

**සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය**
**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ II "ආ" පන්තියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ ඉහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයැදුම්කරුවන්ගේ වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම අයැදුම්කරු මෙම තනතුරට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අවස්ථාවේ දී විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

03. මෙම තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (iv) MN-3 අනුව මාසික වැටුප් පරිමාණය - රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 ක් හිමි වේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

05. අයැදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට අයැදුම්කරුවන් පහත සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අවශ්‍යය.

*අධ්‍යාපන සුදුසුකම් :—*

*අ.පො.ස. (සා.පෙළ) :*
සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම.

*අ.පො.ස. (උ.පෙළ) :*
ජීව විද්‍යාව/සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, කෘෂිකර්මය රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන් දෙකක් සමග විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) එකවර සමත්වීම.

*වෘත්තීය සුදුසුකම්.*—රජය විසින් පිළිගත් ආයතනයක් මගින් පිරිනමනු ලබන කෘෂිකර්මය පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකයක් ලබාතිබීම.

06. *අයැදුම් කළ යුතු ක්‍රමය :*

(*අ*) මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇති ආදර්ශ ආකෘතිය අනුව ඒ 4 (21cm x 29cm) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් 1 සිට 5 දක්වා ඡේද මුල් පිටුවට ඇතුළත් වන පරිදි අයැදුම්පත් පිළියෙළ කළ යුතු ය;

(*ආ*) ඉල්ලුම්පත්‍ර පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ විභාගයේ නම සිංහල අයැදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය;

(*ඇ*) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයැදුම්පත් 2012.02.29 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය;

(*ඈ*) අයැදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය;

(*ඉ*) විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003.02.13 ට බැර වන ලෙස විභාග ගාස්තු වශයෙන් රුපියල් 300 ක් දිවයිනේ ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගත් මුදල් කුවිතාන්සිය අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත;

(*ඊ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, තැපෑලේ දී සිදුවන නැතිවීම් හා ප්‍රමාදවීම් ගැන දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ;

(*උ*) රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු හෝ නීතිඥයෙකු හෝ රජයේ සේවයේ මාණ්ඩලික තනතුරක් දරන නිලධාරියෙකු විසින් අයදුම්පත්‍රයේ අපේක්ෂක/අපේක්ෂිකාවගේ අත්සන සහතික කළ යුතු ය;

(*ඌ*) දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්තවූවන් තම ආයතන ප්‍රධානියා මගින් මෙම අයදුම්පත ඉදිරිපත් කළ යුතු ය.

07. *විභාග පරිපාටිය :*

(*අ*) අයැදුම්පත්‍ර එවා ඇති අපේක්ෂක/අපේක්ෂිකාවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයැදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.;

(*ආ*) මෙම විභාග 2012 මාර්තු මාසයේ දී පමණ පවත්වනු ඇත. විභාග දිනට දින 07 කට කලින් ප්‍රවේශපත්‍ර නොලබන අපේක්ෂක/අපේක්ෂිකාවන් පහත සඳහන් විස්තර ඉදිරිපත් කරමින් නොපමාව බත්තරමුල්ල, පැලවත්ත විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙතින් විමසිය යුතු ය.

(i) විභාගයේ නම :————.
(ii) අපේක්ෂක/අපේක්ෂිකාවගේ සම්පූර්ණ නම :————.
(iii) ලිපිනය :————.
(iv) ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කළ දිනය, ලියාපදිංචි කළ තැපැල් කාර්යාලය හා අංකය :————.
(v) විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සියේ අංකය, දිනය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.

(*ඇ*) විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(*ඈ*) *අනන්‍යතාව .-* තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. මේ සඳහා -

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත ; හෝ

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

තම අනන්‍යතාව තහවුරු කිරීමට ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(*ඉ*) *විෂය නිර්දේශය :*

(i) බුද්ධි පරීක්ෂණය (විෂයය අංක 01) (කාලය :පැය 01 යි. මුළු ලකුණු 100 යි) අපේක්ෂකයාගේ තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව සිතීමේ හැකියාවත්, තීරණ ගැනීමේ ශක්තියත් නිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත ය.

(ii) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය (පර්යේෂණ සහකාර) (විෂයය අංක 02) (කාලය පැය 02 යි මුළු ලකුණු 100 යි)

*තාක්‍ෂණ ප්‍රශ්න පත්‍රයේ විෂය නිර්දේශය :*
*තාක්ෂණික ප්‍රශ්න පත්‍රය :*

(අ) කෘෂිකාර්මික මූලධර්ම—

1. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප හා භෝග නිෂ්පාදනය කෙරෙහි එහි බලපෑම
2. පස්වර්ග, පාංශු සංරක්ෂණය, ශාක පෝෂණය හා ජල සංරක්‍ෂණය
3. පළිබෝධ හඳුනාගැනීම, වර්ගීකරණය හා මර්ධනය
4. ශාක ප්‍රචාරණය, තවාන් පාලනය හා පටක රෝපණය
5. කෘෂිකර්මය හා පරිසරය
6. වතු වගාව, ක්‍ෂේත්‍ර භෝග වගාව, මිශ්‍ර භෝග වගාව හා කෘෂි වන වගාව
7. පසු අස්වනු තාක්‍ෂණය

8. අපනයන කෘෂිකර්ම භෝග අර්ථ දැක්වීම, ප්‍රචාරණය, ක්ෂේත්‍ර ස්ථාපනය, නඩත්තුව, රෝග පළිබෝධ පාලනය හා අස්වනු සැකසීම;

9. ගොවිපල පාලනය හා සැළසුම් කිරීම :
   (අ) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත සංවර්ධනය හා සම්බන්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන එකිනෙකෙහි දායකත්වය.
   (ඇ) රසායනාගාර උපකරණ හඳුනාගැනීම :
   ප්‍රයෝජන හා මූලික සිද්ධාන්ත—
   1. රසායනාගාර වීදුරු භාණ්ඩ හඳුනාගැනීම, ප්‍රයෝජනය හා පිරිසිදු කිරීම.
   2. රසායනතික ද්‍රව්‍ය, ආරක්ෂිතව පරිහරණය, ගබඩා කර තැබීම

(ඊ) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු ය.

(උ) මෙම තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය කොළඹ දී පමණක් පැවැත් වේ.

08. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) තෝරාගනු ලබන අපේක්ෂක/අපේක්ෂිකාවන් දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද, සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

(ii) දැනට පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කයන් හා සේවා ස්ථාන පහත සඳහන් වේ.

| | |
|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කය - | වල්පිට පර්යේෂණ මධ්‍යස්ථානය |
| මාතර දිස්ත්‍රික්කය - | පලොල්පිටිය කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානය |
| මාතලේ දිස්ත්‍රික්කය - | මාතලේ මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය |

09. *බඳවා ගැනීමේ ක්‍රමය*.—තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්නපත්‍රයකටම 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂයින්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණුදීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේ දී ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

10. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

11. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු ම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩදෙනු ලැබේ.

ඩබ්. ඩී. එල්. ගුණරත්න,
අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

[ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයැදුම්පත්‍රය**

***ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවාවේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ II "ආ" පන්තියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2011***

Application for the Competitive Examination for Recruitment to the post of Research Assistant of Class II "B" of the Sri Lanka Technological Service in the Department of Export Agriculture - 2011

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල 2
දෙමළ 3
ඉංග්‍රීසි 4 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. නම :
   1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SILVA, A.B.

   1.2 සම්පූර්ණ නම :————.
   (සිංහලෙන්/දෙමළෙන්)

02. ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

   2.1 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

   2.2 දුරකථන අංකය (ඇත්නම්) : [ | | | | | | | | | ]

03. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී 1 පුරුෂ 0 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. විවාහක/අවිවාහක බව :

විවාහක -2 අවිවාහක -1 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

06. 6.1 උපන් දිනය :

වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

   6.2 ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :

අවු : [ | ] මාස : [ | ] දින : [ | ]

07. *අධ්‍යාපන සුදුසුකම් :*

(*අ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය :

| | *පළමු වතාව* | *දෙවන වතාව* |
|---|---|---|
| *විභාගයේ නම* | :………………… | ………………… |
| *වර්ෂය හා මාසය* | :………………… | ………………… |
| *විභාග අංකය* | :………………… | ………………… |
| *භාෂා මාධ්‍යය* | :………………… | ………………… |

*පළමු වතාව* *දෙවන වතාව*

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |
| 3. | | | 3. | | |
| 4. | | | 4. | | |
| 5. | | | 5. | | |
| 6. | | | 6. | | |
| 7. | | | 7. | | |
| 8. | | | 8. | | |

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (*උසස් පෙළ*) විභාගය :

වර්ෂය හා මාසය : …………………
විභාග අංකය : …………………
භාෂා මාධ්‍යය : …………………

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

(*ඇ*) *වෘත්තීය සුදුසුකම්* :—

| *ඩිප්ලෝමාව සහ ආයතනයේ නම* | *සමත් වූ වර්ෂය* | *විභාග අංකය* | *සමත් විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|---|---|---|
| | | | | |

08. (*අ*)

| | |
|---|---|
| විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ අංකය | |
| දිනය | |
| මුදල් ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | |
| ගෙවන ලද මුදල | |

විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙනසේ මෙහි අලවන්න. (කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

09. *අයැදුම්කරුගේ සහතිකය :*

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගතහොත්, මා නුසුදුස්සකු වීමට යටත් වන බවත්, පත්කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි.

තව ද මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම එකඟ වෙමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

10. *අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම* :—

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන …………යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ………… දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බව ද, සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ඇති/නැති බව මම සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා පදවි නාමය.

දිනය :————.

01-679

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.